සැ. යු.-2015.11.20 දින පළවූ අංක 1942 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළනොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,943 - 2015 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා - 2015.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1228 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1232 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීන් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 දෙසැම්බර් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1225- B 81005—5,402 (2015/11)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක. :-

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීයමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියෙන් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍ය වේ.

කාතිවරයාට මසකට රුපියල් 6,000ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2015 දෙසැම්බර් මස 19 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් සමඟ ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2015 නොවැම්බර් මස 05 වැනි දින.
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12.

**උපලේඛනය**

1. **බදුල්ල** - බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **බලපිටිය, ඇල්පිටිය** - ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය, ඇල්පිටිය අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

3. **කොළඹ නැගෙනහිර** - අළුත්කඩේ, ග්‍රෑන්පාස්, මාලිගාවත්ත, සෙබස්තියන් පාර, නිව් බසාර්, තොටලඟ, කොච්චිකඩේ, කොටහේන, පාදුක්ක, හෝකන්දර, මීගොඩ, ගොඩගම, පනාගොඩ, මාලඹේ, තලංගම උතුර, කොටිකාවත්ත, බුද්ගමුව යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

4. **හාරිස්පත්තුව, පූජාපිටිය** - මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු - පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

5. **හැටන්** - නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

6. **හොරණ** - හොරණ අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

7. **ඉරක්කාමම්** - අක්කරපත්තු අධිකරණ කලාපයේ වරිප්පොත්තාන්චේනයි, ඔට්ටිපුරම්, අමීරලිපුරම්, 10 කොට්ඨාසය ඒ, 11 කොට්ඨාසය ඒ, නල්ලවන්දිමලයි, ඉරක්කාමම් ග්‍රාම සේවා කොට්ඨාසය 01 සිට 09 දක්වා වූ ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

8. **කරවාහුපත්තුව උතුර (කල්මුණේ)** - අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

9. **කල්පිටිය** - පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

10. **මන්නාරම** - මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම සහ මාන්දයි ආදායම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

11. **මාතර** - මාතර අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

12. **මාවනැල්ල** - මාවනැල්ල අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

13. **නුවරඑළිය**, නුවරඑළිය අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

14. **කරවාහපත්තු දකුණ (සායින්තමරුදු)** - අම්පාර දිස්ත්‍රික්කයේ සායින්තමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

15. **සමන්තුරේ** - අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංක 01 සහ 02, මල්කම්පිටිය, නයිනාකාඩු, මල්වත්ත, නාවිදන්වෙලි, අන්නයිවිලි යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

16. **තම්බලගමුව සහ කන්තලේ** - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තම්බලගමුව සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

17. **ත්‍රිකුණාමලය** - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරය, ගුවට්ස් සහ මොරාවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

18. **උඩතලවින්න (උඩ, මැද සහ පහතදුම්බර)** - මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර, මැදදුම්බර, පහතදුම්බර ආදායම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

19. **උඩුනුවර** - මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ආදායම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

20. **වාලච්චේන (කෝරලයිපත්තුව)** - මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලයිපත්තුව නැගෙනහිර (ඕට්ටමාවඩි හැර) ආදායම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

21. **වවුනියා** - වවුනියා අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

22. **යාපනය** - යාපනය දිස්ත්‍රික්කයේ යාපනය, පේදුරුතුඩුව හා කයිට්ස් අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

23. **කොළඹ උතුර** - කොටුව, පිටකොටුව, මරදාන, සුදුවෙල්ල, බොරැල්ල, කුප්පියාවත්ත, දෙමටගොඩ, මාලිගාකන්ද, මාදම්පිටිය, මෝදර, මට්ටක්කුලිය, කොටා වීදිය, කොලොන්නාව, අංගොඩ, වැල්ලම්පිටිය යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

24. **කොළඹ දකුණ** - කොළඹ අධිකරණ කලාපයේ කොම්පඤ්ඤවීදිය, කුරුඳුවත්ත, කොල්ලුපිටිය, බම්බලපිටිය, හැවලොක් ටවුම, නාරාහේන්පිට, වැල්ලවත්ත, කිරුළපනේ යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

25. හම්බන්තොට - හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

26. අවතැන්වුවන් - පුත්තලම දිස්ත්‍රික්කයේ වෙසෙන අවතැන්වුවන් සඳහා වූ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

27. අකුරණ - මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත් වලින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ක්වාසි වරයෙකු පත් කිරීමේ ඉල්ලුම් පත්‍රය**

ක්වාසි බල ප්‍රදේශය :

1. මුලකුරු සමග නම :

උ. අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උ. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකථන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම් :

1. ........................................................................................................................
2. ........................................................................................................................
3. ........................................................................................................................
4. ........................................................................................................................
5. ........................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් :

1. ……………………………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………………………
4. ……………………………………………………………………………………………………………
5. ……………………………………………………………………………………………………………

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? : ඔව් නැත

15. විවාහක ද ? : ඔව් නැත

16. භාර්යාව ජීවත්ව සිටී ද? : ඔව් නැත

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපල වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද ? : ඔව් නැත

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : ඔව් නැත

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? : ඔව් නැත

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිව යුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

**සටහන :**
සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

11-644

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2016/2017

01. ගුරු විද්‍යාලයන්හි දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අත්සන් කළ විධිමත් පත්වීම් ලබා ඇති රජයේ පාසල්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන්,

1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර ඇති පෞද්ගලික පාසල් නාම ලේඛනයේ ඇතුළත් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති ගුරුවරුන්,

1.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති පිරිවෙන් ගුරුවරුන්,

1.4 මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දුරස්ථ, ප්‍රින්සෙට් හෝ උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීමේ ගුරු පුහුණු පාඨමාලාව හදාරා අසාර්ථක වූ බව අදාළ ගුරු පුහුණු බලධාරීන් විසින් සහතික කර ඇති ගුරුවරුන්.

02. *විශේෂ උපදෙස් :*

2.1 ගුරු විද්‍යාලයන්හි පවතින පුරප්පාඩු මත පාසලේ වැඩ භාරගැනීමේ ජ්‍යෙෂ්ඨතාවය පදනම් කර ගෙන තෝරා ගැනීම් සිදු කෙරේ. ගුරු සේවයේ උසස්වීම්වල දී වෘත්තීය සුදුසුකම් නොමැතිවීම නිසා පාඩු සිදුවනවා පමණක් නොව පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය ඇති කර ගැනීමට ද බාධාවක් වී ඇත. මෙම සියලු කරුණු සලකා සියලුම උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් පුහුණුව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

2.2 මෙම පාඨමාලාව අවුරුදු දෙකක නේවාසික පුහුණුවක් වන අතර, නේවාසික පහසුකම් නොමැති අවස්ථාවල විදුහල්පතිගේ ලිඛිත අවසරය මත ගුරු විදුහලට ආසන්නයේ නේවාසික වීමට අවසර දෙනු ලැබේ.

2.3 පාඨමාලා පැවැත්වීම සඳහා ඇති පහසුකම් අනුව පාඨමාලාව පැවැත්වෙන ගුරු විද්‍යාලය තීරණය වන බැවින් සැමවිටම ආසන්න ගුරු විද්‍යාලය ලබා දීමට නොහැකි වේ.

2.4 ගුරු විද්‍යාලයෙහි පුහුණු කාලය තුළ වෙනත් පාඨමාලා හැදෑරීම හෝ වෙනත් බාහිර විභාගවලට පෙනී සිටීම හෝ නොකළ යුතු ය. ඒ පිළිබඳ ලැබෙන තොරතුරු හා පාඨමාලා හැරයාම

පිළිබඳ ව විධිමත් පරීක්ෂණයකින් පසු විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

2.5 මෙම පාඨමාලාව පහත දැක්වෙන ගුරුවරුන්ට අදාළ නොවේ.

(අ) කවර හෝ ගුරු විද්‍යාලයක දැනටමත් පුහුණුව ලබන්නා වූ හෝ පුහුණුව ලබා ඇති ගුරුවරුන්,

(ආ) උපාධිධාරී අභ්‍යාසලාභී ගුරු පත්වීම් හෝ උපාධිධාරී කළමනාකරණ සහායක පත්වීම් හෝ ඒ සමාන කවර හෝ උපාධි පත්වීමක් ලබා ඇති ගුරුවරුන්,

(ඇ) මෙහි අංක 07හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති ගුරුවරුන්,

ඉහත විස්තර අනුව සුදුසුකම් සපුරා නොමැති අය පාඨමාලාවට ඇතුළත් වී ඇති බව දැන ගැනීමට ලැබුණු අවස්ථාවක පුහුණුවන කාලය තුළ දී නම් පුහුණුව අවලංගු කරන අතර, පුහුණුවෙන් පසුව නම් ඔහුගේ හෝ ඇයගේ ගුරු පුහුණු සහතිකය අවලංගු කරනු ලැබේ.

2.6 සෑම අයදුම්කරුවකු විසින් ම පහත සඳහන් ලියකියවිලි ගුරු පුහුණුව සඳහා ලියාපංදිංචි වීමට කැඳවන දිනයේ දී භාරදිය යුතු ය.

(අ) සම්පූර්ණ කරන ලද ඇප බැඳුම්කරය,

(ආ) ගුරු අධ්‍යාපන පාඨමාලා නිම කිරීමෙන් පසුව පත්කරනු ලබන පාසල්වල (රජයේ ගුරුවරුන් රජයේ පාසල්වල හා රජයේ නොවන ගුරුවරුන් අදාළ පාලක මණ්ඩලය යටතේ) නොකඩවා අවුරුදු 05 ක් සේවය කරන බවට රජය හෝ පාලක මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක පිටපත,

2.7 1982 අප්‍රේල් මාසයෙන් පසුව දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරු පත්වීම් ලැබ පුහුණුවට ඇතුළත් වන අය ගුරු පුහුණුවෙන් පසුව ද මුල්පත්වීම ලද එම දිස්ත්‍රික්කවල ම සේවය කිරීමට යටත් වන බව ද සැළකිය යුතු ය,

2.8 ගුරු පුහුණු පාඨමාලාවන් සඳහා ගුරු විද්‍යාලයකට ඇතුළත් වූ පසු කිසිම පුහුණුලාභියෙකුට තම අභිමතය පරිදි පාඨමාලාවෙන් ඉවත්විය නොහැකි ය. එසේ ඉවත් වුවහොත් රජයේ වියදම් තක්සේරු කර අධිභාරය සමග අයකරනු ලැබේ,

2.9 මෙම ගැසට් නිවේදනයේ සඳහන් තොරතුරු මත මතුවන ගැටලු පිළිබඳව අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

03. (i) ගුරු විදුහල්පති විසින් අපේක්ෂා කරනු ලබන තත්ත්වයට නොපැමිණීම සාමාන්‍ය හැසිරීම ගුරු විද්‍යාලයේ විනය ගරුකත්වයට අනුකූල නොවන බව වැටහේ නම් හා ඉගෙනීම පිළිබඳ උද්‍යෝගීතාව දැක්වීමට අපොහොසත් වන්නේ නම් පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව ලබන ගුරුවරයෙකුගේ පාඨමාලාවට සහභාගි වීම සහ පැමිණීම 80% ට අඩු වුවහොත් ගුරු විද්‍යාල අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත. එහෙත් යම් අවස්ථාවක දී විශේෂ කාරණයක් මත අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

(ii) නිවාඩු :

ආයතනික පුහුණුව සඳහා වසර දෙකක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. මෙම අධ්‍යයන නිවාඩු කාලය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණයෙන් ම යොදා ගැනීම අවශ්‍ය ය. එහෙත් ගුරු පුහුණුව ලබන්නාට අත්‍යවශ්‍ය බවට විදුහල්පති සෑහීමකට පත්වේ නම් පමණක් සීමිත දින ගණනක් අනියම් නිවාඩු ලබා ගත හැකි ය. ඒ සඳහා විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ. මෙසේ ලබා ගන්නා නිවාඩුව වර්ෂයකට දින දහයක් නොඉක්ම විය යුතු ය.

අධික ලෙස නිවාඩු ගැනීම හේතුවෙන් පාඨමාලාව අධ්‍යයනය කිරීමේ ප්‍රගතිය අසතුටුදායක බවට කිසියම් අභ්‍යාසලාභියකු පිළිබඳ ව විදුහල්පති වාර්තා කළහොත් පාඨමාලා අධ්‍යයනය අත්හිටුවා පාසල්වලට ආපසු යවනු ලැබේ. වෛද්‍ය නිවාඩු සඳහා රජයේ හෝ රජය පිළිගත් වෛද්‍යවරයෙකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

04. ගුරු විද්‍යාලය විසින් පවත්වනු ලබන පරීක්ෂණවලින් සහ දැවුරුදු ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් ද සමත්වන අයට ගුරු පුහුණු සහතිකය පිරිනමනු ලැබේ.

05. *වැටුප් පරිමාණය :*

ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළව පසුකාලීන සංශෝධනයන්ට යටත්ව පුහුණු ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පසු අදාළ වන වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

06. (i) සෑම අයදුම්කරුවකු ම තමා පත්වීම් ලද විෂයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය. එහෙත් විශේෂ අධ්‍යාපන පාඨමාලාවට පමණක් වෙනත් විෂයයන්ගෙන් පත්වීම් ලද ගුරුවරුන්ට ද ඉල්ලුම් කළ හැකි ය. රජයේ පත්වීම් ලද ගුරුවරුන්ගේ පත්වීම් විෂය, පත්වීම් ලිපියේ සඳහන් නොවන අවස්ථාවල දී තමා අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත් වූ විෂයයන්ගෙන් ගුරු පුහුණුව ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි ය. ඒ සඳහා අදාළ විෂයයන් උගන්වන බවට අනුමත කාලසටහනෙහි පිටපතක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත බඳවා ගත් අයගේ පත්වීම් ලිපියේ පත්වීම් විෂයය සඳහන් නොවන විටක දී එම පත්වීම ප්‍රාථමික ගුරු පත්වීමක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පෞද්ගලික හා පිරිවෙන් ගුරුවරුන්ගේ පත්වීම් ලිපිවල විෂයය සඳහන් නොවන අවස්ථාවල දී තමන් උගන්වනු ලබන විෂයය අනුව පුහුණුව සඳහා තෝරා ගැනේ. ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුත් අනුමත කාලසටහනේ පිටපතක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) යම් පාඨමාලාවක් සඳහා අයදුම්කරුවන් ප්‍රමාණවත් පිරිසක් ඉල්ලුම් නොකළහොත් එම පාඨමාලාව පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ ව අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

| | *පාඨමාලාවේ අංකය* | *පාඨමාලාවේ නම* |
|---|---|---|
| i. | 01 | සිංහල |
| ii. | 02 | ප්‍රාථමික අධ්‍යාපනය |
| iii. | 03 | සමාජ විද්‍යාව |
| iv. | 04 | විද්‍යාව |
| v. | 05 | ගණිතය |
| vi. | 06 | කෘෂි විද්‍යාව |
| vii. | 07 | ගෘහ විද්‍යාව |
| viii. | 08 | ඉංග්‍රීසි |
| ix. | 09 | බුද්ධ ධර්මය |

| | පාඨමාලාවේ අංකය | පාඨමාලාවේ නම |
|---|---|---|
| x. | 10 | ක්‍රිස්තියානි/රෝමානු කතෝලික ධර්මය |
| xi. | 11 | හින්දු ධර්මය |
| xii. | 12 | ඉස්ලාම් ධර්මය |
| xiii. | 13 | චිත්‍ර කර්මය |
| xiv. | 14 | සංගීතය |
| xv. | 15 | නැටුම් |
| xvi. | 16 | අරාබි |
| xvii. | 17 | විශේෂ අධ්‍යාපනය |
| xviii. | 18 | හස්ත කර්මාන්තය හා තාක්ෂණය |
| xix. | 19 | වාණිජ |
| xx. | 20 | දෙමළ |
| xxi. | 21 | ශාරීරික අධ්‍යාපනය |
| xxii. | 22 | දෙවන බස (සිංහල/දෙමළ) |

07. (i) සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකු ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :

I යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

II ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

III දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය හා මව්බස ඇතුළුව විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) හෝ ජා.පො.අ.ස. විභාගය සමත් වී සිටිය යුතු ය.

IV රජයේ පාසල්වල සේවයේ නියුක්ත ගුරුවරුන් 2015.11.27 වැනි දින වන විට ගුරුවරයකු ලෙස අවම වශයෙන් මාස තුනක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

V සෑම අයදුම්කරුවකු ම තම පත්වීමේ ස්වභාවය මුල් පත්වීම් ලිපිය ඇසුරෙන් සනාථ කළ යුතු ය.

(ii) පහත සඳහන් පාඨමාලා තෝරා ගන්නා අයට ඉහත කී සුදුසුකම්වලට අමතර ව මතු දැක්වෙන සුදුසුකම් ද තිබිය යුතු ය.

(අ) සිංහල පාඨමාලාව-
අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ආ) විද්‍යා පාඨමාලාව-

I. අ.පො.ස. (සා/පෙළ) පැරණි නිර්දේශයේ භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය යන විෂයයන්ගෙන් දෙකකටවත් සම්මාන සාමාර්ථය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. (උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව හෝ සමග ජීව විද්‍යාව ගණන් නොගැනේ.); හෝ

II. නව නිර්දේශයේ විද්‍යාව, ගණිතය විෂයයන් සමත්වීම හා විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

III. ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත් වීම.

(ඇ) ගණිතය පාඨමාලාව :

I. අ.පො.ස. (සා/පෙළ) පැරණි නිර්දේශයේ හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය, මූලික ගණිතය, ශුද්ධ ගණිතය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් දෙකකටවත් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

II. අ.පො.ස. (සා/පෙළ) නව නිර්දේශයේ ගණිතය හා විද්‍යාව සමත්වීම හා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

III. ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත්වීම.

(ඈ) කෘෂි විද්‍යා පාඨමාලාව :

I. පැරණි නිර්දේශයේ අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

II. අ.පො.ස. (සා/පෙළ) නව නිර්දේශයේ විද්‍යාව හා කෘෂි විද්‍යාව සමත්වීම හා කෘෂි විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

III. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සමත් වී තිබීම;

හෝ

IV. ජා.පො. අ. ස. විභාගයේ දී නම් ඉහත සඳහන් විෂයයකට ඒ හෝ බී සාමාර්ථයක් ලබා සිටීම. (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි);

හෝ

V. කෘෂිකර්මය සම්බන්ධයෙන් රජයේ ගොවිපලක මාස 06 කට නොඅඩු කාලයක පුහුණුවක් ලබා තිබීම.

(ඉ) ගෘහ විද්‍යා පාඨමාලාව :

I. අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ගෘහ විද්‍යාව, මැහුම් වැඩ යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

II. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ගෘහ විද්‍යාව විෂයය සමත්ව තිබීම;

හෝ

III. ජා.පො.අ.ස. විභාගයේ දී ඉහත කී විෂයයන්ට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි);

හෝ

IV. රජයේ කාර්මික විදුහලක වසරකට නොඅඩු කාලයක් ගෘහ විද්‍යාව හදාරා ලබා ගත් සහතිකයක් තිබීම.

(ඊ) ඉංග්‍රීසි පාඨමාලාව :

I. දැනට ඉංග්‍රීසි ගුරු පත්වීමක් ලබා තිබීම;

හෝ

II. ඉංග්‍රීසි i, ii හෝ iii පෙළ ගුරු සහතික පත්‍රය ලබා දැනට සේවයේ යෙදී සිටීම;

සහ

III. අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

IV. ඊට උසස් විභාගයකින් ඉංග්‍රීසි විෂයය සමත්ව තිබීම.

(උ) ආගම පාඨමාලාව :

I. බුද්ධ ධර්මය, රෝමානු කතෝලික ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය යන පාඨමාලා සඳහා ඉල්ලුම් කරන අය තමා හැදෑරීමට බලාපොරොත්තු වන ආගම විෂයයට අ.පො.ස (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

II. ජා.පො.අ.ස. විභාගයේ දී ආගම විෂයයට ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම; හෝ

III. ඉහත I හි සඳහන් විෂයයකින් හෝ ඊට අදාළ විෂයයකින් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම.

(ඌ) චිත්‍ර කර්ම පාඨමාලාව :

I. රජයේ ලලිත කලායතනයේ සහතික පත්‍රය (චිත්‍ර කර්මය පිළිබඳ තුන් අවුරුදු පාඨමාලාව);

හෝ

II. චිත්‍ර කර්ම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ගුරු සහතික පත්‍රය;

හෝ

III. අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සම්මාන සාමාර්ථය;

හෝ

IV. ජා.පො.අ.ස. විභාගයේ දී ඉහත චිත්‍ර කර්මය විෂයයට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (සෞන්දර්යය විෂය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි);

හෝ

V. අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

(එ) සංගීත පාඨමාලාව :

I. ලංකා ගාන්ධර්ව සභාවේ සංගීතය පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග සංගීත විභාගයේ හෝ ජාතික සංගීත විභාගයේ ප්‍රථම විභාගය;

හෝ

II. රජයේ සංගීත විදුහලේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය;

හෝ

III. උත්තර ලංකා පෙරදිග සංගීත ගුරුවරුන්ගේ සංගමයේ සංගීතය පිළිබඳ සහතික පත්‍රය (5 වැනි ශ්‍රේණිය);

හෝ

IV. පිළිගත් ඉන්දීය සංගීත ආයතනයක සංගීතය පිළිබඳ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය;

හෝ

V. අ.පො.ස (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේ දී සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක්;

හෝ

VI. අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සංගීත විෂයයට සාමාර්ථයක්; හෝ

VII. ජා.පො.අ.ස. විභාගයේ දී සංගීත විෂයයට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (සෞන්දර්යය විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි).

(ඒ) නැටුම් පාඨමාලාව :

I. ලංකා ගාන්ධර්ව සභාවේ නැටුම් පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග නැටුම් විභාගයේ හෝ ජාතික නැටුම් විභාගයේ ප්‍රථම විභාගය;

හෝ

II. රජයේ නැටුම් විද්‍යාලයේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය;

හෝ

III. පිළිගත් ඉන්දීය නැටුම් ආයතනයක අන්තර් මාධ්‍ය සහතික පත්‍රය;

හෝ

IV. අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී නැටුම් විෂයය සඳහා සම්මාන සාමාර්ථය;

හෝ

V. අ.පො.ස. (උ/පෙළ.) විභාගයේ දී නැටුම් විෂයය සඳහා සාමාර්ථයක්;

හෝ

VI. ජා. පො. අ. ස. විභාගයේ දී නැටුම් විෂයය සඳහා ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම (සෞන්දර්ය විෂයය කුමක් දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි).

(ඔ) අරාබි පාඨමාලාව :

I. විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල් ආලිම් ප්‍රාරම්භක පරීක්ෂණයේ I වැනි හා II වැනි පරීක්ෂණය සමත්වීම හෝ අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී අරාබි විෂයයට සාමාර්ථයක් ලබා තිබීම; හෝ

II. පිළිගත් මද්රසා ආයතනයක අවසාන පරීක්ෂණයෙන් සමත්වීම.

මේ සඳහා මද්රසා ආයතන පහත සඳහන් වේ. :-

1. බහිජතුල් ඊබ්‍රාහිමියා අරාබි විදුහල, කොටුව, ගාල්ල
2. ගෆූරියා අරාබි විදුහල, මහරගම
3. මද්රසතුල් බාරි අරාබි විදුහල, වැලිගම
4. කාසිමියා අරාබි විදුහල, පුත්තලම
5. නද්වතුල් උලමා අරාබි විදුහල, මුත්තූර්
6. නැගෙනහිර ලංකා අරාබි විදුහල, අඩ්ඩාලච්චේන
7. මදාසතුල්පුලා අරාබි විදුහල, කාත්තන්කුඩි
8. මුස්ලිම් කාන්තා අරාබි විදුහල, කල්එළිය
9. මද්රසතුල් ජාප්රියා අරාබි විදුහල, ගාල්ල
10. හිදාදියා අරාබි විදුහල, මාදම්පේ
11. නද්වතුල් බුහාරි අරාබි විදුහල, කින්නියා
12. මද්රසතුල් නූර්නියා අරාබි විදුහල, කොටුවේගොඩ, මාතර
13. මක්කියා අරාබි විදුහල, ගාල්ල

හෝ

වෙනත් පිළිගත් ආයතනයක් (සම්මුඛ පරීක්ෂණයේ දී පිළිගත් ආයතනයක් බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.)

III ඉහත දැක්වෙන I හෝ II හි සඳහන් සුදුසුකම් සහිතව වෙනත් ගුරු පත්වීම් ලබා සිටින ගුරුවරුනට ද මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

(ඕ) විශේෂ අධ්‍යාපන පාඨමාලාව :

මෙම පාඨමාලාවේ අංශ තුනකි.

1. දෘශ්‍යාබාධිත (අන්ධ) ළමයින්ට ඉගැන්වීම
2. ශ්‍රව්‍යාබාධිත (බිහිරි) ළමයින්ට ඉගැන්වීම
3. මන්ද මානසික (මන්ද බුද්ධික) ළමයින්ට ඉගැන්වීම

තමන් කැමති අංශය අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. තෝරා ගැනීමේ දී ඉංග්‍රීසි දැනුම තිබෙන අය පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ක) හස්ත කර්මාන්ත හා තාක්‍ෂණ කුසලතා පාඨමාලාව :

I අ. පො. ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී,

ලී වැඩ
ලෝහ වැඩ
විවීම
මැටි ශිල්පය
මෝටර් කාර්මික ශිල්පය
ගුවන් විදුලි කාර්මික ශිල්පය
පෙදරේරු ශිල්පය යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

II ජා. පො. අ. ස. විභාගයේ දී නම් අදාළ විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයය කුමක්දැයි විදුහල්පතිගේ සහතිකයක් අවශ්‍යයි);

හෝ

III රජයේ කාර්මික විද්‍යාලයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක් යටතේ පවත්වන අවුරුද්දකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා ලබාගත් පුහුණු සහතිකයක් තිබීම.

(ග) වාණිජ පාඨමාලාව :

I අ. පො. ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, ගණකාධිකරණය, යතුරු ලියනය, ලඝු ලේඛනය, වාණිජ්‍යය හා මූල්‍ය යන විෂයයන්ගෙන් දෙකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;
හෝ

II අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ඉහත සඳහන් විෂයයන් දෙකක් සමත්ව තිබීම; හෝ

III රජයේ කාර්මික විද්‍යාලයක එක් අවුරුදු වාණිජ පාඨමාලා සහතිකය ලබා තිබීම.

(ජ) දෙමළ පාඨමාලාව :

I අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ට) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව :

I දැනට ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරු පත්වීමක් ලබා තිබීම.

(ඩ) සමාජ විද්‍යාව පාඨමාලාව :

I අ. පො. ස. (සා/පෙළ) විභාගයේදී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී සමාජ අධ්‍යයනය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

II ජා. පො. අ. ස. විභාගයේ දී සමාජ අධ්‍යයනය විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම; හෝ

III භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහාවත් අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

(න) දෙවන බස (සිංහල/දෙමළ) පාඨමාලාව :

ඉහත 7 (1) හි සඳහන් සුදුසුකම් ඇති දෙවන බස (සිංහල/දෙමළ) විෂයය සඳහා පත්වීම් ලද ගුරුවරුන්ට මේ පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

08. රජයේ අනුමත පෞද්ගලික පාසලක ස්ථිර ගුරු මණ්ඩලයක සේවයේ නියුක්ත සාමාන්‍ය පන්තිවල සතියකට පැය 20ක් ඉගැන්වීම් කරන ගුරු භවතුන් අතුරෙන් සීමිත සංඛ්‍යාවක් පුහුණුව සඳහා තෝරාගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පාසල් පෞද්ගලික පාසල් වශයෙන් සලකනු ලැබේ.

I 1951 වර්ෂයේ දී ගාස්තු අය කිරීමේ පාසල් බවට පත් වූ උපකෘත පාසල්,
II 1960.12.01 වැනි දිනට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත් වූ පාසල්,
III අධ්‍යාපන අමාත්‍යාංශය විසින් (ප්‍රාදේශීය/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නොවේ.) අනුමත කර ඇති පෞද්ගලික පාසල් හා පිරිවෙන්.

සියලු ම පෞද්ගලික පාසල්වල සේවය කරන අයදුම්කරුවන්ට 2015.11.27 වැනි දිනට අවම වශයෙන් අවුරුද්දක අඛණ්ඩ සේවයක් තිබිය යුතු අතර, ඔවුන්ගේ පළමු පත්වීමේ ලිපිය හා අදාළ ගුරුභවතා අනුමත ගුරු මණ්ඩලයට අයත් බවට සහතික කරන ලද ලිපියක් අදාළ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂගෙන් ලබාගෙන සම්මුඛ පරීක්‍ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට 2015.11.27 වැනි දිනට අවම වශයෙන් අවුරුදු දෙකක (02) සේවා කාලයක් තිබිය යුතු ය. 1959 පිරිවෙන් පනත හෝ 1979 අංක 64 දරන පනත යටතේ අනුමත සේවය මේ සඳහා ගණන් ගනු ලැබේ.

දැනට පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට ඉල්ලුම් කළ හැක්කේ සිංහල, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා බුද්ධ ධර්මය යන පාඨමාලාවන්ට පමණි. (පත්වීම් ලද විෂයයෙන්ම ගුරු පුහුණුව ලැබිය යුතු ය.) විද්‍යායතන පිරිවෙන්වල උගන්වන අනුමත ගුරුවරුන්ට පමණක් මීට අමතරව සංගීතය, චිත්‍ර, නැටුම්, වාණිජ, ශාරීරික අධ්‍යාපනය සහ කෘෂි විද්‍යාව යන පාඨමාලා සඳහා ද ඉල්ලුම් කළ හැකි ය.

සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල් ගුරුවරුන් පාලක මණ්ඩලයේ කළමනාකරුගෙන් ද, පිරිවෙන් ගුරුවරුන් කෘත්‍යාධිකාරීගෙන් ද, පහත සඳහන් කරුණුවලට අදාළ ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. :-

I පුහුණුවන කාලයේ දී ගුරු භවතා සේවයෙන් නිදහස් කළ හැකි බවට,

II පුහුණුවන කාලය තුළ ගුරු භවතාට වැටුප් ගෙවන බවට,

III පුහුණුව අවසානයේ දී පාලක මණ්ඩලය විසින් අදාළ ගුරු භවතා නැවත සේවයේ යොදවා ගන්නා බවට,

IV පුහුණුව සඳහා තෝරා ගන්නා පිරිවෙන් ගුරු භවතුන් වෙනුවට වෙනත් ගුරු භවතුන් නොඉල්ලන බවට හා ඔහුගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවට,

රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වලින් තෝරා ගන්නා ගුරුවරුන් පුහුණුව සඳහා ලියාපදිංචි වීමට පෙර "පුහුණුවෙන් පසු රජයේ පාසල්වල රැකියා නොඉල්ලන බවට" පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතු ය.

රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් ඉදිරිපත් වන ගුරුවරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කළ මුල් පත්වීම් ලිපි ඉදිරිපත් කළ යුතු ය. වයස අවු. 18ට පෙර පත්වීම් ලබා සිටින ගුරුවරුන්ගේ පත්වීම් දිනය ගණන් ගැනෙනුයේ අවුරුදු 18 සම්පූර්ණ වූ දින සිට ය. වෙනත් නිලධාරියෙකු මෙම පත්වීම් ලිපිය අත්සන් කර ඇත්නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සත්‍ය බවට සහතික කර තිබිය යුතු ය.

09. *තෝරා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම*

I. මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතු ය.

(අ) ගුරු අධ්‍යාපන පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන මාධ්‍යයෙන් අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ආකෘති පත්‍රය 8" x 12" (A4) කඩදාසියක දෙපැත්තේ පිළියෙල කළ යුතු ය.

(ඇ) කිසිම කොටුවක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන් කළ යුතු අතර එකිනෙකට ගොඩ ගැසෙන සේ පිළියෙල නොකළ යුතු ය.

II. අයදුම්කරු විසින් අයදුම්පත්‍රය නොඅඩුව හා නිවැරදි ව පිරවිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. :-

(අ) සෑම අයදුම්කරුවකු ම තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදි ම සඳහන් කළ යුතු ය;

(ආ) තම පාසලේ විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. පාසලේ ප්‍රධානියා ඉල්ලුම් කරන්නේ නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතුය.;

(ඇ) දක්වා ඇති උපදෙස් පරිදි පිළියෙල කරන ලද සියලු ම අයදුම්පත්‍ර පහත දක්වා ඇති ආකෘතියේ පරිදි සකස් කරන ලද ලිපි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ "**ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2016/2017**" ලෙස ද පාඨමාලාව, මාධ්‍යය සහ කලාපය ද සඳහන් කර 2015.12.28 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "**අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල**" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු ය.

**ලියාපදිංචි තැපෑල**

*"ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන*
*පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන්*
*තෝරා ගැනීම - 2016/2017"*

පාඨමාලාව :—————.
මාධ්‍යය :—————.
කලාපය :—————.

අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

(ඈ) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර,

(i) අයදුම්පත්‍රය ලැබුණු බවට දන්වනු නොලැබේ,
(ii) අයදුම්පත්‍රයට සෙසු ලියවිලි අමුණා නොඑවිය යුතු ය,
(iii) සුදුසුකම් පරීක්ෂා කිරීමට පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයේ දී සියලු ම සහතික හා ලිපි ලේඛනවල මුල් පිටපත් සහ සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

III. "ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2016/2017" පාඨමාලා සඳහා සතිඅන්ත හෝ දුරස්ථ පාඨමාලා නොපැවැත්වේ.

10. මෙම ගැසට් නිවේදනයෙහි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 09 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

අධ්‍යාපන අමාත්‍යාංශය

*ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2016/2017*

1. මාධ්‍යය :
2. මුල් පත්වීමේ ලිපිය අනුව පාසලේ වැඩ භාරගත් දිනය :
3. පාඨමාලාව :
4. මුල් පත්වීමේ ස්වභාවය, විෂය සහ ඔබ අයත් වන සේවය/ශ්‍රේණිය :

   (*a*) මුල් පත්වීමේ ස්වභාවය :

   (*b*) විෂය :

   (*c*) අයත් වන සේවය : (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)
   ශ්‍රී ලංකා ගුරු සේවය - 01
   ගුරු සහායක - 02
   වෙනත් (සඳහන් කරන්න) - 03

   (*d*) ශ්‍රේණිය :

5. ඔබ දුරස්ථ හෝ සති අන්ත ගුරු පුහුණුව ලබා සම්පූර්ණ කර නැත්නම් පමණක් පහත විස්තර සපයන්න :

   (*a*) පාඨමාලාව :————.
   (*b*) වර්ෂය :————.
   (*c*) අවසාන විභාග ප්‍රතිඵලය :————.

6. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු දෙවනුව ලියන්න. උදා : PERERA, A. B.) :
   Rev./Mr./Mrs./Ms. :————.

7. මුලකුරුවලින් දැක්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.)
   :————.

8. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)

   පුරුෂ - 1 ස්ත්‍රී - 2

9. ජාතික හැඳුනුම්පත් අංකය :

10. (අ) උපන් දිනය (2015.11.27 වැනි දිනට වයස) :

    (ආ) අවුරුදු :————. මාස :————. දින :————.

11. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

12. ඊ-මේල් ලිපිනය (ඇත්නම් ) :————.

13. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න) :——.

14. වර්තමාන සේවා ස්ථානය, ලිපිනය, දිස්ත්‍රික්කය සහ කලාපය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න) :

    (i) සේවා ස්ථානය :————.
    (ii) ලිපිනය :————.
    (iii) දිස්ත්‍රික්කය :————.
    (iv) කලාපය :————.
    (v) සේවා ස්ථානයේ ස්වභාවය : (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)

    (*a*) රජයේ පාසලකි - 01
    (*b*) වතු පාසලකි - 02
    (*c*) රජයේ අනුමත පිරිවෙනකි - 03
    (*d*) රජයේ අනුමත පෞද්ගලික පාසලකි - 04
    (*e*) වෙනත් - 05

15. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) අ. පො. ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල :

| | | පළමුවර | | දෙවනවර |
|---|---|---|---|---|
| | *වර්ෂය* | | | |
| | *විභාග අංකය* | | | |
| *අනු. අංකය* | *විෂයය* | *ලබාගත් ශ්‍රේණිය* | | |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| 9 | | | | |
| 10 | | | | |

(ii) අ. පො. ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල :

| | | පළමුවර | දෙවනවර |
|---|---|---|---|
| | *වර්ෂය* | | |
| | *විභාග අංකය* | | |
| *අනු. අංකය* | *විෂයය* | *ලබාගත් ශ්‍රේණිය* | |
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |

16. සේවා විස්තරය :

| අනු. අංකය | සේවය කළ පාසල | සේවා කාලය | දුෂ්කර ද නැද්ද යන බව |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |

17. අයදුම්කරුගේ ප්‍රකාශය :

(i) ඉහත දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ම විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව අනාවරණය වුවහොත් පාඨමාලාවට තෝරා නොගන්නා බවත්, පාඨමාලාවට තෝරා ගැනීමෙන් පසු යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කිරීමට යටත් වන බවත් මෙයින් පිළිගනිමි.

(ii) දැනට වෙනත් කිසිම ආයතනික ගුරු පුහුණුවකට සහභාගි නොවන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

18. විදුහල්පතිවරයාගේ නිර්දේශය :

(i) දැනට ගුරු මණ්ඩලයේ සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව :————.

(ii) ශිෂ්‍ය සංඛ්‍යාව :—————.

(iii) අයදුම්කරු ගුරු පුහුණුව සඳහා නිදහස් කළහොත් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසලේ සිටින ගුරු හවතුන් සංඛ්‍යාව ප්‍රමාණවත් ද? :——.

ඉහත අයදුම්කරු මාගේ පාසලේ ......... දින සිට ගුරු සේවයේ/ ගුරු සහායක ලෙස සේවය කරන බවත්, අයදුම්කරු ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා......... හිමි/මයා./මිය./මෙනෙවිය තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

—————,
විදුහල්පතිගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

දිනය :—————.

19. ................................... හිමි/මයා./මිය./මෙනෙවිය ......... කලාපයේ ................. විද්‍යාලයේ ගුරු සේවයේ/ගුරු සහායක ලෙස සේවයේ නියුතු බවත්, ඔහු/ඇය ................. දිනැති මුල් පත්වීම අනුව ......... දින වැඩ භාරගෙන ඇති බවත්, ......... දින සිට මේ දක්වා මෙම පාසලේ සේවය කරන බවත්, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර ම විසින් පරීක්‍ෂා කර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා .......................... හිමි/ මයා./ මිය/මෙනෙවිය තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

—————,
කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :—————.

20. ................................... හිමි/මයා/මිය/මෙනෙවිය ......... කලාපයේ ................. විද්‍යාලයේ ගුරු සේවයේ/ගුරු සහායක ලෙස සේවය කරන බව ද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර ම විසින් පරීක්‍ෂාකර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා ................. හිමි/මයා./මිය./මෙනෙවිය තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

—————,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :—————.

11-786

---

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට**

***2016 වසරේ පළමු අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම***

*පූර්ණ කාලීන පාඨමාලා :*

| *No.* | *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fees (Rs.)* |
|---|---|---|---|---|---|
| 1 | Computer Hardware Technician A+ (CISCO IT Essential) | IV | 6 | D | 12,000 |
| 2 | CCNA Academy Program | IV | 6 | D | 40,000 |
| 3 | Computer Graphic Designer | IV | 6 | A | 12,500 |

| *No.* | *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fees (Rs.)* |
|---|---|---|---|---|---|
| 4 | Adobe (Multimedia) | IV | 6 | D | 15,000 |
| 5 | NVQ - IV in ICT (ICT Technician) | IV | 6 | Q | 7,500 |
| 6 | NVQ - V in ICT with free CISCO IT Essential A + & ORACAL Academy (ertification Training** | V | 12 | M | 40,000 |
| 7 | Computer Graphic Designer (ශ්‍රවණාබාධිත) | IV | 6 | - | Free |
| 8 | Diploma in Drafting Technology | IV | 12 | N | 20,000 |
| 9 | Diploma in Quantity Surveying | V | 12 | O | 60,000 |
| 10 | Baker | IV | 6 | A | 30,000 |
| 11 | Cook | IV | 6 | A | 30,000 |
| 12 | Waiter/Steward | III | 6 | I | 4,500 |
| 13 | Automobile Mechanic | IV | 18 | A | 6,000 |
| 14 | Automobile A/C Mechanic | IV | 6 | A | 2,700 |
| 15 | Beautician | IV | 6 | B | 20,000 |
| 16 | Hairdresser | IV | 6 | B | 30,000 |
| 17 | Diploma in Industrial Management | Non | 6 | E | 25,000 |
| 18 | Electrician | IV | 12 | A | 5,000 |
| 19 | Offset Lithographic Operator | IV | 6 | I | 5,500 |
| 20 | Machinist (CNC Milling) | IV | 6 | C | 6,000 |
| 21 | Machinist | IV | 12 | A | 3,500 |
| 22 | Driver - Heavy Vehicle | Non | 3 | F | 9,000 |
| 23 | Driver - Light Vehicle | Non | 3 | G | 10,500 |
| 24 | Pre School Teacher | III | 12 | R | 10,000 |
| 25 | Automobile Painter | III | 6 | B | 2,000 |

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2015.12.31 දිනට වයස අවු. 16 ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර, එම පාඨමාලා සෙනසුරාද/ඉරිදා දිනයන්හි හා සන්ධ්‍යා කාලීනව ද පැවැත් වේ.

ප්‍රතිලාභ :

* දේශීය විදේශීය රැකියා අවස්ථා.
* කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්.
* ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක්.
* විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම.
* දීමනා සමග මාස 06ක වැඩිදුර පුහුණුව.

*අර්ධ කාලීන පාඨමාලා*

| *Course* | *Duration (Hours)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 120 | A | 12,000 |
| CCNA Academy Program | 300 | D | 40,000 |
| PC Based Application Assistant (MS Office) | 100 | I | 9,500 |
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 22,500 |
| ICT Technician (NVQ IV) | 350 | A | 20,000 |
| IC3 +International Certificate* | 120 | K | 10,000 |
| Developing Web Application using Joomla | 150 | K | 5,000 |
| CCN Security | 150 | J | 20,000 |
| Photographer | 150 | P | 40,000 |
| Auto Cad (2D)* | 80 | L | 7,500 |
| Auto Cad (3D)* | 80 | L | 8,000 |
| Baker | 100 | B | 14,000 |
| Cook | 100 | B | 14,000 |
| Cut & Style hair (Ladies) | 100 | B | 10,250 0 |
| Facials and skin care Treatment | 100 | B | 10,500 0 |
| Make up and Bridle Dressing | 80 | B | 11,000 0 |
| Automobile Technician (Engine/Petrol/Diesel) | 160 | B | 10,500 0 |

| *Course* | *Duration (Hours)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|
| Draughtsmanship (Building Drawing) | 150 | D | 13,500 |
| CNC Programming | 125 | A | 9,000 |
| Electrical Wiring Industrial | 120 | A | 14,500 |
| Electrical Wiring Domestic | 120 | A | 13,000 |
| Motor Control System | 100 | A | 13,000 |
| Automobile A/C Mechanic* | 125 | B | 13,000 |
| Driver (Light Vehicle) | 105 | G | 13,500 |

*සැ. යු.* :- පාඨමාලා ගාස්තු සංශෝධනය විය හැක. තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2015.12.31 වැනි දිනට පෙර පහත ලිපිනයට එවන්න.

සුදුසුකම් :

A. අ.පො.ස.(සා.පෙළ) විෂයන් 06කින් සමත් වීම.

B. 9 වසර සමත් වීම.

C. ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2 L3 සහතික ලබා තිබීම.

D. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වීම.

E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/ වැඩ මූලික සහායක/ වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.

F. 9 වසර සමත්වීම හා අවුරුදු 21ට වැඩිවීම හා සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය ලබා වසර 3ක් ගත වී තිබීම.

G. 9 වසර සමත්වීම සහ අවුරුදු 18ට වැඩිවීම.

H. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

I. අ. පො.ස. (සා. පෙළ) පෙනී සිටීම.

J. CCNA පාඨමාලාවක් හදාරා සිටීම.

K. අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි සහිතව විෂයන් 06 කින් සමත් වී තිබීම.

L. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලී සිටීම.

M. අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්වීම සහ සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම.

N. අ. පො. ස. (උ/පෙළ) විෂයන් 3 කින් සමත්වී තිබීම.

O. අ.පො.ස.(උ. පෙළ) ගණිතය ඇතුළුව විෂයන් 02කින් සමත් වීම.

P. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.

Q. අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි ගණිතය සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වීම.

R. අ. පො. ස. (උ/පෙළ) විෂයන් 02 කින් සමත්වී තිබීම.

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය.

අංක 354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථන අංක : 011-2592233, 011-7277111 (IT Center)
ඊ-මේල් : nvtinarahenpita@vtasl.gov.lk
ෆැක්ස් : 0112 - 553856, 0112-592233.

11-764

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වෙන කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017 සඳහා ඇතුළත් කරගැනීමේ තරග විභාගය

2016/2017 කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවට (NVQ Level - 5) ඇතුළත් කරගැනීමේ තරග විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් 2016 ජනවාරි මාසය තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

02. කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව (NVQ Level -5) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකර්ම විද්‍යාලවල සහ තෝරාගත් වෙනත් පුහුණු ආයතන තුළ පවත්වාගෙන යාමට නියමිතය.

2.1 කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව ගැහැණු, පිරිමි දෙපක්‍ෂයටම විවෘත වන අතර, පවත්වනු ලබන තරග විභාගයේ ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් පුහුණු ආයතන වල ඇති ධාරිතාවයට සරිලන ප්‍රමාණයක් තෝරා ගනු ලබයි.

2.2 විභාගය සමත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්‍ෂා කර බැලීමට පමණක් සම්මුඛ පරීක්‍ෂණයක් සිදු කරන අතර, එයට ලකුණු ලබාදීමක් සිදු නොකරයි.

2.3 මෙම පාඨමාලාව සිංහල හා දෙමළ භාෂාවලින් පවත්වනු ලබයි.

2.4 මෙම පාඨමාලාව පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවක් වේ. සියලු පුහුණුවන්නන් ආයතනයේ පුහුණු කාල පරිච්ඡේදය තුළ අනිවාර්යයෙන්ම නේවාසිකාගාරවල නැවතී පුහුණුව ලබාගත යුතු ය.

2.5 පුහුණු ආයතන තුළ වසරක පුහුණුවෙන් පසු, තුන් මසක් නම් කරන ලද ආයතනයක් තුළ රැකියාස්ථ පුහුණුවක යෙදීම අනිවාර්ය වේ.

2.6 ඉහත පුහුණුව සාර්ථකව අවසන් වූ පසු තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පුහුණුලාභීන් ඇගයීමට ලක් කොට NVQ Level -05 මට්ටමේ සහතිකයක් ලබාදේ.

2.7 මෙම සහතිකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් කෘෂිකර්මයට සම්බන්ධව රජයේ ආයතනවල තාක්‍ෂණ සහකාර මට්ටමේ රැකියා සඳහා වන සුදුසුකමක් වේ.

03. *පාඨමාලාවට ඇතුළත්වීමේ සුදුසුකම් :*

3.1 සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ඨ සාමාර්ථද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතු ය) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතු ය. මෙහිදී එක් වරකදී විෂයන් 05ක් සමත්ව තිබිය යුතු ය.

*සහ*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක්වත් සමත්වී තිබිය යුතු ය. (උසස් පෙළ සඳහා ගණිත විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත්වී තිබීම මෙම පාඨමාලාව තෝරා ගැනීමේ සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.)

3.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25ට වඩා වැඩි නොවිය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.3 කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් ලබාදෙන පහත NVQ Level - 4 පාඨමාලාවන් හදාරා සහතික ඇති අයදුම්කරුවන්ටද මෙම පාඨමාලාවට අයදුම් කළ හැක.

* පැල තවාන් සංවර්ධන සහායක
* ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
* උද්‍යාන අලංකරණ ශිල්පී

හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන එම මට්ටමේ පාඨමාලා

3.3.1 ඉහත NVQ Level 4 පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික හිමි අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ට සාමාර්ථද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව, (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතු ය) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතු ය. මෙහිදී එක් වරකදී විෂයන් 05ක් සමත්ව තිබිය යුතු ය.

*සහ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පිළිගත් ආයතනයක NVQ Level 4 මට්ටමේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා ලබාගත් සහතික පත්‍රයලත් අයකු වීම.

3.3.2 මෙම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට වඩා නොවැඩි විය යුතු ය.

3.3.3 මෙම අයදුම්කරුවන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් වෙනම තරග විභාගයක් පවත්වනු ලබන අතර එයින් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් හට බඳවා ගැනීමට හැකි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 10% අවස්ථාවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. මෙම අයදුම්කරුවන් සඳහා විභාගය පවත්වන දිනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පසුව දැනුම් දෙනු ලැබේ.

04. *පාඨමාලාවට අයදුම්කිරීම* :

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර හෝ පරිගණක ගත කරගෙන 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ. එහි අංක 01 සිට අංක 08 තෙක් මුල් පිටුවේ ද, 9 සිට 12 දක්වා දෙවන පිටුවේ ද, 13 සිට 15 දක්වා තුන්වන පිටුවේ ද, ඉතිරිය 4 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විසින් වග බලාගත යුතු වේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 700කි. අපේක්ෂකයා විසින් මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ "අංක 057100179027204" දරන ගිණුමට රු. 700 ක මුදලක් බැර කර ලබාගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අලවා එවීමට කටයුතු කළ යුතු ය.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2015 දෙසැම්බර් 28 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2016/2017 එක් අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතු ය.

05. *විභාග මධ්‍යස්ථාන* :

2016/2017 කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2016 ජනවාරි මාසය තුළදී පහත සඳහන් නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ :-

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1. | ගම්පහ |
| 2. | අම්පාර |
| 3. | දඹුල්ල |
| 4. | ගාල්ල |
| 5. | හම්බන්තොට |
| 6. | කුරුණෑගල |
| 7. | මහනුවර |
| 8. | වවුනියාව |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අපේක්ෂකයන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත මත අනුව හෝ අයැදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර හෝ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. *විභාග ක්‍රමය* :

6.1 *තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ :-*

| | *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රය - | 01. කෘෂිකර්මය (ලකුණු 100 යි) (අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය). | පැය 1 යි | 10.00 පැය - 11.00 පැය |
| දෙවන ප්‍රශ්න පත්‍රය - | 02. බුද්ධි පරීක්ෂණය (ලකුණු 100යි) (රටා, සබදතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ). | පැය 1 යි | 11.30 පැය - 12.30 පැය |

6.2 මෙහි 3.1, 3.2, 3.3.1 සහ 3.3.2 ඡේදයන්හි සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් කර පහත අ, ආ, සහ ඇ හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඔබගේ ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳව දැන්වීම වඩා ඵලදායි වනු ඇත:-

(*අ*) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්,
(*ආ*) මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්,
(*ඇ*) අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායා පිටපතක්.

6.3 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට එවනු ලැබේ. ඉහත විෂයයන් දෙකෙහි එකතුවෙහි වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන බව සැළකිය යුතු ය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

6.4 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

ආචාර්ය ආර් ආර්. ඒ. විජේකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

*NVQ 5 මට්ටම කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා එක් අවුරුදු පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2016*

Competitive Examination for Admission to National Diploma in Agricultural Production Technology One Year Course Level 05- 2016

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

| |
|---|
| |

1.

| *විභාගයට පෙනී සිටින නගරය :* | *එහි අංකය :* |
|---|---|
| 1 වැනි තේරීම ............ | ............ |
| 2 වැනි තේරීම ............ | ............ |
| 3 වැනි තේරීම ............ | ............ |

*(ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව)*

2. *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*

| | |
|---|---|
| සිංහල මාධ්‍යය - 2<br>දෙමළ මාධ්‍යය - 3 | ............... |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.

| | |
|---|---|
| *පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍යය :*<br>සිංහල මාධ්‍යය - 2<br>දෙමළ මාධ්‍යය - 3 | ................. |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| පුරුෂ - 0 | |
| ස්ත්‍රී - 1 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.

| | |
|---|---|
| අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)<br>විෂයයන් තුනක් එකවර - 3<br>විෂයයන් දෙකක් හෝ එකක් එකවර - 2 | සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය :<br>................. |

(3.1 ඡේදයට අනුව)

6. *(අ)* (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(පැහැදිලි අකුරින්)

(ii) අගට යෙදූ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.
*උදා.* : ANANDA, K. C. B.

*(ආ)* (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.

7. (i) සම්පූර්ණ ලිපිනය :—————.

(ii) විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.

(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංක :—————.

(i) ස්ථාවර :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ii) ජංගම :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

8. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

9. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.

(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

10. උපන් දිනය : අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

11. 2015.12.21 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

12. *අධ්‍යාපන සුදුසුකම් : (ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතු වේ.) -NVQ 4 පාඨමාලාව හදාරා සුදුසුකම් ලැබූ අය සඳහා අදාළ නැත.*

(අ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබා ගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. සිංහල | | |
| | | 2. ගණිතය | | |
| | | 3. විද්‍යාව | | |
| | | 4. කෘෂිකර්මය | | |
| | | 5. සමාජ අධ්‍යයනය | | |
| | | 6. ඉතිහාසය | | |
| | | 7. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | | |
| | | 8. කෘෂි ආහාර තාක්ෂණය | | |
| | | 9. උද්‍යාන විද්‍යාව | | |

අ. පො. ස. (උ. පෙ.) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාව හදාරා ඇත් ද? ඔව්/නැත (අදාළ නොවන වචනය කපා හරින්න.)

(ඈ) අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් සමත් විෂයයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

(ඇ) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න. (මුල් පිටපත් එවිය යුතු නොවේ.)

අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :————.

NVQ මට්ටම් 4 පාඨමාලාව හදාරා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා

(i) අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ii) හදාරා ඇති NVQ මට්ටම් 4 පාඨමාලාව පිළිබඳ විස්තර :

(අ) පාඨමාලාවේ නම :————.
(ආ) පාඨමාලා කාලසීමාව :————.
(ඇ) පාඨමාලාව හැදෑරූ ආයතනය :————.
(ඈ) NVQ සුදුසුකම් ලැබූ වසර (සහතිකවල පිටපතක් මේ සඳහා ඉදිරිපත් කල යුතු ය.) :————.

(iii) අ. පො. ස. (උ. පෙළ.) විභාග ප්‍රතිඵල (තිබේ නම්) :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

14. ජීව විද්‍යාව විෂය ධාරාව හදරා සුදුසුකම් ඇති, NVQ 4 පාඨමාලාවෙන්ද සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පමණක් පහත කොටස අදාල වේ.

ඔබ තෝරාගැනීමේ විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන්නේ NVQ 4 සුදුසුකම් ඇතුවද නැතහොත් උසස් පෙළ සුදුසුකම් මතද යන්න සඳහන් කරන්න. (අදල එක් කොටුවක පමණක් කතිරය යොදන්න.)

| | |
|---|---|
| NVQ 4 පාඨමාලාවේ සුදුසුකම් මත | |
| උසස් පෙළ සුදුසුකම් මත | |

15. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්)

(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

16. විභාග ගාස්තු පිළිබඳ විස්තර :

16.1 මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට රු. 700 ක් බැර කර ලබාගත් කුවිතාන්සියේ අංකය :————.

16.2 මුදල් ගෙවන ලද මහජන බැංකු ශාඛාවේ නම :————.

| |
|---|
| මුදල් ගෙවූ කුවිතාන්සියේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.<br>එහි ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ඔබ ළඟ තබාගන්න. |

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මා අ. පො. ස. (සා. පෙළ.) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් හයෙන් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,30,060 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා/මිය/මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, **ගැසට් නිවේදනයේ සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් ඇති බවට ගැසට් නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්‍ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි.** තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන
සුදුසුකම් සහතික කරන අයගේ
නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

11-724

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.